පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය :- ගණිතය

සතිය- 3 වාරය 1 සතිය

7 ශ්‍රේණිය

Prepared by- සුනිල් පද්මසිරි, ර/බල/විද්‍යාලෝක වි.

➢ ගණිතය ඒකක 21 යටතේ පෙළ පොතෙහි පිටු අංක 92 යටතේ ඇති නිදසුන් අංක 1, 2 හා 3 ද පිටු අංක 94 යටතේ නිදසුන් අංක 1 හා 2 ද හොඳින් අධ්‍යයනය කිරීමෙන් පහත ගැටලු විසඳන්න.

01. පහත දී ඇති එක් එක් අනුපාතය සඳහා තුල්‍ය අනුපාතය බැගින් ලියන්න.

i 3:2 ii 4:3 iii 5:2 iv 7:4 v 11:3

02. තුල්‍ය අනුපාත ලැබෙනසේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

i 3:5 = 12:… ii 4:7 = …:21 iii 5:… = 20:12 iv …:4 = 54:24

03. පහත දී ඇති අනුපාත සරලම ආකාරයෙන් ලියන්න.

i 20:12 ii 15:12 iii 12:24:30 iv 18:36:45

04. පහත දී ඇති එක් එක් ප්‍රකාශනයේ ඇති ප්‍රමාණ අනුපාත ලෙස ලියා සරලම ආකාරයෙන් දක්වන්න.

i පන්තියේ ගැහැණු ළමයි 24 ක් හා පිරිමි ළමයි 30 ක් සිටියි.

ii රථ ගාලක යතුරු පැදි 18 ක් හා මෝටර් රථ 15 ක් ඇත.

iii පොතක මිල රු 35 ක් පෑනක මිල රු 14 ක් ද වේ.

iv ජලය ලීටරයක් හා පළතුරු යුෂ මිලි ලීටර 200 ක් මිශ්‍ර කර බීමක් සාදයි.

v උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් 24 ක් ද වාණිජ අංශයේ සිසුන් 36 ක් ද කලා අංශයේ සිසුන් 20 ක් ද සිටියි.

vi කමිසයක මිල රු 800 ක් ද කලිසමක මිල රු 1200 ක් ද ගවුමක මිල රු 800 ක් ද වේ.

vii පිටි 1 kg ද සීනි 500 g ක් ද තල 500 g ක් ද මිශ්‍ර කර තල අලුවා සාදයි.

05. චමින්ද හා එරන්ද අතරේ රු 4000 ක මුදලක් 5:3 අනුපාතයට බෙදිය යුතුව ඇත. එක් එක් අයට හිමිවිය යුතු මුදල් වෙන වෙන ම සොයන්න.

06. 7 ශ්‍රේණියේ පිරිමි හා ගැහැණු ළමයි අතර අනුපාතය 3:4 වේ. එම පන්තියේ සිටින මුළු සිසුන් ගණන 42 නම් පිරිමි හා ගැහැණු ළමයි සංඛ්‍යා වෙන වෙන ම සොයන්න.

07. ත්‍රිකෝණයක පාද අතර අනුපාතය 3:5:7 වේ. එහි පරිමිති 60 cm නම් කුඩාම පාදයේ දිග සොයන්න.

08. කාර්යාලයක ලිපිකරුවන්, කම්කරුවන් හා කළමණාකරුවන් පමණක් සිටියි. ඔවුන් අතර අනුපාතය 4:9:2 වේ. මුළු සේවකයන් ගණන 105 නම් කම්කරුවන් ගණන සොයන්න.

09. පවුලක දුවගේ, පුතාගේ හා මවගේ වයස් අතර අනුපාතය 2:3:8 ද තිදෙනාගේ වයස්වල එකතුව 52 ද වේ. තිදෙනාගේ වයස් වෙන වෙන ම සොයන්න.

10. එක්තරා වසරක පාසලකින් ශිෂ්‍යත්ව, සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග වලට පෙනී සිටි සිසුන් අතර අනුපාතය 8:7:5 වේ. එම වසරේ එම විභාගවලට පෙනී සිටි පාසලේ සිසුන් ගණන 100 නම් සාමන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන් ගණන සොයන්න.